**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2022**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේපල,පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර.16) 51 ඡේදයට අනුව, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් භාවිතයට ගැනෙන වටිනාකම රු. මිලියන 66.8 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර ගිණුම් ගත කර නොතිබුණි. | කාණ්ඩ 4ටම අයත් ස්ථාවර වත්කම් සියල්ලගේම ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කිරීම ප්‍රායෝගිකව අපහසු කටයුත්තක් වන නමුත් මෙකී විගණන නිරීක්ෂණය සැළකිල්ලට ගෙන 2023 වර්ෂයේදී මේ සඳහා අදාල කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය. |
| (ආ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 හි 5.5 ඡේදය ප්‍රකාරව අයකර ගැනීමේ හැකියාව පිළිබඳව විධිමත් ඇගයීමක් සිදුකර අවශ්‍ය ගැලපීම් සිදු නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාර්ෂික නියාමන ගාස්තු ශේෂය වූ රු. මිලියන 252 හි සාධාරණ වටිනාකම පිළිබඳ පහත කරුණු හේතුවෙන් විගණනයේදී තහවුරු කරගත නොහැකි විය .<br>(i) ඉහත ශේෂය තුල 2014 හා 2015 වර්ෂයන්ට අදාලව ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂය | මුදල් අමාත්‍යාංශය විසින් දෙනු ලබන උපදෙස් පරිදි 2023 වසරේදී මේ සම්බන්ධ ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර දිගු කාලීනව අය නොවී පවතින ශේෂයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු ය. |

රු. මිලියන 81.8 ක් ඇතුලත් වී තිබීම.

(ii) කොමිෂන් සභාවේ ගිණුම් පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වාර්ෂික නියාමන ගාස්තු ශේෂය රු. මිලියන 249.7 ක් වුවද ලංකා විදුලිබල මණ්ඩලයට අනුව එම ශේෂය රු. මිලියන 125.4 ක් වූයෙන් රු.මිලියන 124.3 ක වෙනසක් නිරීක්ෂණය විම.

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ලැබිය යුතු වාර්ෂික නියාමන ගාස්තු | රු. මිලියන 2.24 | ශේෂ සනාථ කිරීම් | ලැබිය යුතු වාර්ෂික නියාමන ගාස්තු 2022.12.31 දින වන විටත් නොගෙවූ සියළු ආයතනවලට 2023 ජුලි 25 දින නියාමන ගාස්තු ගෙවන ලෙස ලිපි මගින් දැනුම් දී ඇත. | මූල්‍ය ප්‍රකාශනයෙහි දක්වා ඇති ලැබිය යුතු වාර්ෂික නියාමන ගාස්තු සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් ලබා ගත යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත** | | | |
| (i) 16 සහ 17 වගන්තිය | ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් කර්මාන්ත එනම් විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළයුතු වුවත් වුවත් ඛනිජ තෙල් | ඛණිජ තෙල් කර්මාන්තය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අවශ්‍ය සියළු කටයුතු සම්පාදනය කර ඇති නමුත් අදාල පනත නොමැති වීම හේතුවෙන් මෙම කටයුතු ප්‍රමාද වී ඇත. ජල සේවා සපයනු ලබන ආයතන හා | ඛනිජතෙල් හා ජලය නියාමනය කිරීමට අදාළ නීතිමය රාමුව සකස් කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | නීතිගත සංස්ථාව හා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වර්ෂ 20කට වැඩි කාලයක් මුළුල්ලේ ඛණිජ තෙල් හා ජලය යන කර්මාන්ත කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීමට නොහැකි වී තිබුණි. | සහසම්බන්ධතාවය ගොඩනැගීම සඳහා කර්මාන්තය සඳහා වෙන් වූ පනතක අවශ්‍යතාවය පවතී. මේ සඳහා ජල සැපයුම් අමාත්‍යංශය සමඟ සමීපව කටයුතු කරමින් මෙම නෛතික විධිවිධාන සකස් කර ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම දැනටමත් අවසන් කර ඇත. | |
| (ii) 31(4) වගන්තිය | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට සිදු කර තිබූ රු. මිලියන 675 ක් වන ආයෝජනයන් සඳහා මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | පනතේ විධිවිධාන සමග අනුගත විය යුතුය. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මු.රෙ.261 | සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොත අනුව බැංකු ශේෂය රු. 163,760ක් හා බැංකු ප්‍රකාශය අනුව ශේෂය රු.707,410ක් පමණක් ව තිබියදී සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 7.6 ක ගෙවිය යුතු වියදම් සඳහා චෙක්පත් 27 ක් ලියා ඒවා මුදල් පොතේ සටහන් නොකර අතැති චෙක්පත් පාලන ගිණුමට බැර කොට අත රඳවා ගෙන තිබුණි. | රු. 7,648 859 ක් ලෙස දක්වා ඇත්තේ 2022. 12. 31 වන විට කොමිෂන් සභාව විසින් ගෙවිය යුතු බිල්පත්වල කොටසක එකතුව වේ.මෙසේ නිකුත් කර නොමැති චෙක්පත් තාවකාලික ගිණුමට රඳවා ගැනීම සිදු කරනු ලබයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු අතර ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රමුඛතාවය ලබාදී නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) මු.රෙ. 371 සහ 371 (ආ) | කොමිෂන් සභාවේ මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන් 09 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා 70 කදී රු. 1,480 සිට රු.536,250 දක්වා වූ පරාසයක් යටතේ එකතුව රු.මිලියන 6ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබූ අතර මාණ්ඩලික නිලධාරීන් 11 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා 28 කදී රු.100,000 සීමාව | නව ක්‍රමවේදය හඳුන්වා දීමෙන් පසු මෙසේ අත්තිකාරම් ලබා ගැනීමේ කාර්යය නිසි පරීක්ෂණයක් යටතේ අදාළ නව ක්‍රමවේදය අනුව සිදු වෙමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉක්මවා එකතුව රු. මිලියන 5.2ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. තවද, නියැදි විගණන පරීක්ෂාවට අනුව කොමිෂන් සභාවේ නිලධාරීන් 7 දෙනෙකු සඳහා නිකුත් කර තිබූ රු. මිලියන 3.1 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නියමිත කාලය තුල පියවීම සිදු නොකර තිබියදී නැවත එම නිලධාරීන් වෙත අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | | |
| (iii) මු.රෙ. 1645 | වාහන ලොග් සටහන් පොත් නිසි ලෙස යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරියේදී ලොග් සටහන් පොත් නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | -එම-. |
| (ඇ)2018 ජුලි 18 දිනැති අංක 03/2018 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ I හා II ඡේද | (i) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සිය ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත දීමනා වර්ග 10 ක් යටතේ සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.මිලියන 58.9 ක් ගෙවීම් කර තිබුණි. | 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතේ 12 (1)වගන්තිය (ඇ) අනුව කොමිෂන් සභාව විසින් එහි කාර්ය මණ්ඩලයට පාරිශ්‍රමික ගෙවියයුතු අනුප්‍රමාණ නියම කලයුතු බව සඳහන් කර ඇතතවද . එහි3 වන වගන්තිය මගින් 12(1) වගන්තියේ සඳහන් කර ඇති යම් කාරණයක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ලෙස සඳහන් කර ඇත. ඒ අනුව කොමිෂන් සභාව විසින් කාර්ය මණ්ඩල දීමනා සම්බන්ධයෙන් අවශ්‍ය අත්පොත් සහ මගපෙන්වීම් සකස්කර ඒවා කොමිෂන් සභාවට ඉදිරිපත්කර කොමිෂන් සභාවේ අනුමැතීන්ට යටත්ව ගෙවීම් කර ඇත. | පනතේ ප්‍රතිපාදන යටතේ පිළියෙල කර ඇති ආයතන පරිපාලන හා කාර්ය පටිපාටි සංග්‍රහය සඳහා උක්ත චක්‍ර ලේඛය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. |
| | (ii) කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන් සඳහා රු. මිලියන 8 උපරිම සීමාව හා අවුරුදු 15 කාල සීමාවට යටත්ව ක්‍රියාත්මක කරනු ලබන නිවාස හා දේපල ණය යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 20 දෙනෙකු විසින් රජයේ හා පෞද්ගලික | මෙකී කටයුත්ත සම්බන්ධව කොමිෂන් සභාව නීත්‍යානුකූලව කොමිෂන් සභා පනතේ ඇති ප්‍රතිපාදන ප්‍රකාරව සිදුකර ඇත. කොමිෂන් සභාවේ අනුමැතිය දෙන ලද මානව සම්පත් හා පරිපාලන අත්පොත් අනුව අදාළ දේපළ ණය සඳහා පොලී මුදලින් අනුමත කරන ලද ප්‍රමාණයක් සඳහා පමණක් ප්‍රතිපූර්ණය කිරීම සිදු කර | නිවාස හා දේපල ණය යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ට අනුකූල වන පරිදි කොමිෂන් සභාව විසින් පොලිය ප්‍රතිපූර්ණය කල |

| | | | |
|---|---|---|---|
| | බැංකුවලින් ලබා ගන්නා ලද එකතුව රු. මිලියන 95.6 ක නිවාස හා දේපළ ණය වෙනුවෙන් අංක 15/2007 (IV) දරන හා 2020 දෙසැම්බර් 15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව රු. මිලියන 3.9 ක් පොලී වශයෙන් කොමිෂන් සභාව විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. | ඇත . | යුතුය. |
| (ඈ) 2022 ජනවාරි 14 දිනැති අංක පීඊඩී 1/2015(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් හා අධ්‍යක්ෂක තනතුරු දරන නිලධාරීන් 13 දෙනෙකුට චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමි නිලධාරීන්ට ගෙවිය යුතු අනුමත මාසික ඉන්ධන දීමනාව ඉක්මවා සමාලෝචිත වර්ෂය තුලදී ඉන්ධන ලීටර 4950 ක් සඳහා රු.මිලියන 1.7ක් ආසන්න වශයෙන් ගෙවා තිබුණි. | මෙකී කටයුත්ත සම්බන්ධව කොමිෂන් සභාව නීත්‍යානුකූලව කොමිෂන් සභා පනතේ ඇති ප්‍රතිපාදන ප්‍රකාරව සිදුකර ඇත. | පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවල විධිවිධාන වලට අනුකූල විය යුතුය. |
| (ඉ) 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.3 ඡේදය සහ අංක 01/2015 (i) හා 2016 ඔක්තෝබර් 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය | සමාලෝචිත වර්ෂය තුලදී කොමිෂන් සභාවේ නිලධාරීන් 25 දෙනෙකුට රු.60,000 බැගින් මාසිකව නිල වාහන දීමනාව ගෙවා තිබීම හේතුවෙන් එම නිලධාරීන්ට වැඩිපුර ගෙවා තිබූ වාහන දීමනාව රු. මිලියන 2.7 ක් විය. ඊට අමතරව වාහන දීමනා ලබා ගන්නා නිලධාරීන් 12 දෙනෙකුට කොමිෂන් සභාව විසින් මාසිකව රු.20,000 බැගින් රියදුරු දීමනාව ලෙස එකතුව රු.මිලියන 2.5ක් ගෙවා තිබුණි. | මෙකී කටයුත්ත සම්බන්ධව කොමිෂන් සභාව නීත්‍යානුකූලව කොමිෂන් සභා පනතේ ඇති ප්‍රතිපාදන ප්‍රකාරව සිදුකර ඇත. | -එම- |
| (ඊ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය හා 2022 ජූලි 06 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 09 | කොමිෂන් සභාවේ බඳවා ගැනීම් හා උසස්කිරීම් පටිපාටිය සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි . | මෙකී කටයුත්ත සම්බන්ධව කොමිෂන් සභාව නීත්‍යානුකූලව කොමිෂන් සභා පනතේ ඇති ප්‍රතිපාදන ප්‍රකාරව සිදුකර ඇත. | කළමණාකරන සේවා චක්‍රලේඛ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (උ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 හා 3.3 ඡේදය | මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් භාවිතයට ගෙන තිබූ වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදු කර හෝ එහි වාහනවල ඉන්ධන පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වූ සටහන් පවත්වා නොතිබුණි. | මෙම කටයුත්ත 2023 වර්ෂයේදී සිදු කිරීමට කටයුතු යොදා ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඌ) 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 වන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (ආ) ඡේදය හා 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 2 (ආ) ඡේදය | 2014 දෙසැම්බර් 15 වන දින මිලදීගෙන තිබූ රු.5,750,000 ක වටිනාකමින් යුත් අංක CAC-6509 දරණ PEOGEOT 408 වර්ගයේ කාර් රථය 2023 පෙබරවාරි 10 දින සිට 2023 අගෝස්තු 31 දින දක්වා මාස 06 ක් පමණ කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම මෝටර් රථය වෙනුවෙන් තවදුරටත් පිරිවැය දැරීම වෙනුවට එය විකිණීම සුදුසු බැවින් ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර වාර්තාවක් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| **(එ) මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය උපදේශන සංග්‍රහය** | | | |
| (i) 5.5.2 හා 5.5.3 ඡේදය | සමාලෝචිත වර්ෂයේ වවුචරපත් නියැදි පරීක්ෂාවට අනුව වගකිව යුතු නිලධාරියකුගේ අනුමැතියකින් තොරව අවස්ථා 12 කදී රු.1,176,299 ක ගෙවීම් සිදුකර තිබුණි. | මේ සඳහා නව ක්‍රමවේදය හඳුන්වා දීමෙන් පසු මෙසේ අත්තිකාරම් ලබා ගැනීමේ කාර්යය නිසි පරීක්ෂණයක් යටතේ අදාළ නව ක්‍රමවේදය අනුව සිදු වෙමින් පවතී . | කොමිෂන් සභාවේ මූල්‍ය උපදෙස් අත්පොතට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) 13.2.2 ඡේදය | නියැදි විගණන පරීක්ෂාවට අනුව කොමිෂන් සභා නිලධාරීන්ට ගෙවා තිබූ රු.1,137,456 ක් වන දීමනා වවුචරපත් 51ක් නිසි ලෙස සහතික නොකර ගෙවා තිබූ අතර රු.313,550 ක් වන අතිකාල දීමනා වවුචරපත් 19 ක් සඳහා අනුමත කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | 2023 වසරේ සිට නිවැරදි ලෙස සියලු තැන්හි අනුමත කරන නිලධාරියා හා සහතික කරන නිලධාරියා විසින් අත්සන් තබා ඇත. | -එම- |
| (iii) 12.8.3 (b)(iii) ඡේදය | කාර්ය මණ්ඩලයේ නිලධාරීන් වෙත පමණක් මිලදී ගැනීමේ අත්තිකාරම් නිකුත් කල හැකිව තිබුණ ද, ඊට පටහැනිව කොමිෂන් සභාව විසින් | මෙම ක්‍රමය වර්තමානයේ දී නිවැරදි කර ඇති අතර ආයතනවලට දෙන චෙක්පත් අත්තිකාරම් ලෙස සටහන් | -එම- |

| | | | |
|---|---|---|---|
| | අවස්ථා 27 කදී බාහිර පාර්ශවයන් 18ක් වෙත භාණ්ඩ හා සේවා සැපයුම් සඳහා එකතුව රු. මිලියන 4.7 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. ඒ අනුව කොමිෂන් සභාවෙන් පරිබාහිර පාර්ශවයන්ට එහි අරමුදල් අවිධිමත් ලෙස පරිහරණය කිරීමට අවස්ථාව සලසා දී තිබුණි. | කරනු නොලැබේ. | |
| (iv) 12.8.3 (b) (iv) ඡේදය | තත්කාර්ය අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමේ කාර්යය අවසන් වී දින 03 ක් ඇතුලත අත්තිකාරම නිරවුල් කළ යුතුව තිබුණද, කොමිෂන් සභාව විසින් අවස්ථා 71 කදී නිලධාරීන් හා බාහිර ආයතන 27 ක් වෙත නිකුත් කර තිබුණු එකතුව රු.මිලියන 6.9 ක් වූ අතුරු අග්‍රිම දින 12 සිට දින 195 ක් දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නොපියවූ අත්තිකාරම් ශේෂය රු.205,670 ක් වූ අතර ඒවා පියවීමේ ප්‍රමාද කාලය දින 119 සිට දින 317 ක කාලපරාසයක පැවතුනි. | අත්තිකාරම් පියවීම නොපමාව සිදු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති අතර අත්තිකාරම් පියවීම දැඩිව නිරීක්ෂණය කර පාලනය කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 287.6 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 109.5 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 178.1 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මුළු ආදායම් සියයට 44 කින් වැඩිවීම සහ උපදේශන සේවා වියදම් හා මෙහෙයුම් වියදම් පිළිවෙලින් සියයට 41 කින් හා සියයට 5 කින් අඩුවීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ අඩුවීම පහත දැක්වේ.

| විස්තරය | විචලනය | | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| | වැඩිවීම/(අඩුවීම) රු.මිලියන | ප්‍රතිශතය (%) | |
| විචලා ලියාපදිංචි ගාස්තුව | 70 | 29 | ලිහිසි තෙල් අලෙවිකරන ආයතනයන්හි විකුණුම් ආදායම් ඉහල යාම. |
| වාර්ෂික නියාමන ගාස්තු | 56 | 29 | වාර්ෂික නියාමන ගාස්තු අනුපාතයන් පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩිවීම. |
| වෙනත් ආදායම් | 75 | 295 | ආයෝජන ආදායම් ඉහළ යාම. |
| උපදේශන සේවා ගාස්තු | (11) | (41) | උපදේශන සේවා වියදම් පහළ යාම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂය තුලදී ආරම්භ කර තිබූ පරිගණක පද්ධති 6 ක් ස්ථාපිත කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුලදී නිම කලයුතුව තිබුණද එසේ සිදුකොට නොතිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 6.6 ක් වැයකර තිබුණි. | 2023 ජූලි හා අගෝස්තු මාසයන්හිදී සම්පූර්ණ කරන බව දන්වා ඇත**.** | කොන්ත්‍රාත් ප්‍රමාදයන් වැලැක්වීමට සමීප අධීක්ෂණයක් සිදු කල යුතුය. |
| (ii) | නිලධාරීන්ගේ ගමන් වියදම්, ආහාර හා නවාතැන් දීමනා කොමිෂන් සභා කාර්යාලයේ සාමාන්‍ය වියදම් පටිපාටිය අනුව සිදුනොකර 2022 වර්ෂයේදී පවත්වා තිබුණු මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් 79 ක් වෙනුවෙන් නිලධාරීන් 42 දෙනෙකුගේ යැපීම් හා සංයුක්ත දීමනා ලෙස එකතුව රු. මිලියන 8.8 ක් තත්කාර්ය අතුරු අග්‍රිම මඟින් පියවා තිබුණි. | අත්තිකාරම් ගෙවීම ආයතනයේ අනුමත ක්‍රමවේදය අනුව සිදු කර ඇත.<br>මෙසේ රු. 8,807,632 ක් වියදම් කර ඇත්තේ පනත ප්‍රකාරව සිදුකලයුතු කටයුතු හා ආයතනයෙන් බැහැරව සිදු කලයුතු කටයුතු සඳහා වේ .<br>නව ක්‍රමවේදය අනුව හදිසි ගෙවීම් ලෙස ගෙවීම් සිදුකරනු නොලැබේ. | කාර්ය මණ්ඩලයට අදාළ වියදම් සාමාන්‍ය ගෙවීම් ක්‍රමවේදය අනුව සිදු කල යුතුය. |

| | | |
|---|---|---|
| (iii) අපේක්ෂිත වියදම වඩාත් නිවැරදිව ඇස්තමේන්තු කිරීමකින් තොරව අවශ්‍ය ප්‍රමාණයට වඩා සැලකිය යුතු අතිරික්ත මුදල් ප්‍රමාණයක් අත්තිකාරම් වශයෙන් ලබා දීම නිසා එම අතිරික්ත මුදල් කිසියම් කාල පරිච්ඡේදයක් අත රඳවා ගෙන නැවත මුදලින්ම පියවා තිබූ අතර නියැදි විගණන පරීක්ෂාවට අනුව එසේ ලබා දී තිබූ මුළු අත්තිකාරම් මුදල රු. මිලියන 2.9 ක් වී තිබුණි. ඒ අතරින් අවස්ථා 4කදී නිකුත් කල රු.134,070 ක අත්තිකාරම් කිසිදු කාර්යයක් සඳහා යොදා නොගෙන නැවත මුදලින්ම පියවා තිබුණි. | මෙවැනි තත්ත්වයන් අවම කිරීමට වර්තමානයේ අදාල කටයුතු සිදු කර ඇත. | වඩාත් තාත්වික හා නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු අතර ඒවා අනුමත කිරීමට ඒ පිළිබඳව අවධානය යොමුකළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කලමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2019 දෙසැම්බර් 17 දිනැති අංක 8/2019 දරන මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන තම ආයතනයන්හි භාණ්ඩ, වැඩ, උපදේශන සේවාවන් ලබා ගැනීම පිණිස විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය තුල 2020 ජනවාරි 31 දිනට පෙර ලියාපදිංචි විය යුතු අතර 2.4 ඡේදය පුකාරව පිළියෙල කරන ලද වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පෙර රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන නිල වෙබ් අඩවියට උඩුගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කොමිෂන් සභාව ඊට අනුගතව කටයුතු කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 8/2019 දරන චක්‍රලේඛයට අනුගත වන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) උක්ත චක්‍රලේඛයේ 2.2ඡේදය ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා, රාජ්‍ය ප්‍රසම්පාදන හා පරිගණක | එම චක්‍රලේඛනයට අනුගත වන ලෙසට දැනුවත් කරන ලදී. | -එම- |

භාවිතය පිළිබඳ දැනුම ඇති මාණ්ඩලික නිලධාරියෙකු සම්බන්ධතා නිලධාරියෙකු ලෙස පත් කළ යුතු වුවත් කොමිෂන් සභාව එයට අනුගතව කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ ප්‍රගති වාර්තාව අනුව ක්‍රියාකාරකම් 7 ක කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණු අතර ක්‍රියාකාරකම් 16 ක ප්‍රගතිය සියයට 30කට වඩා අඩු මට්ටමක පැවතුනි. | කොවිඩ් තත්ත්වය, රුපියල අවප්‍රමාණය වීම යනාදිය මීට හේතු විය. | අදාළ කාර්යයන් හැකිතාක් සැලසුමට අනුව සිදුකළ යුතුය. |